# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2249/16 - 2021 ඔක්තෝබර් මස 13 වැනි බදාදා - 2021.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළෙඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2021 ඔක්තෝබර් මස 14 දින සිට ආරම්භ වන මාස 06 කාල සීමාවක් සඳහා 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2021 අප්‍රේල් මස 27 දිනැති අංක 2225/13 දරන අතිවිශෙෂ *ගැසට් පත්‍රය* මගින් අර්තාපල් (රේගු සංකේතාංක 0701.90) සඳහා ප්‍රකාශිත නියමය 2021 ඔක්තෝබර් මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**බැසිල් රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 ඔක්තෝබර් මස 13 වන දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1A - PG 5577 - 495 (2021/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

| I වන තීරය | | | | II වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1 | 07.01 | 0701.90 | අනෙකුත් අර්තාපල් | කි. ග්‍රෑමයට රු. 50/- |
| 2 | 07.13 | 0713.40.11 | සම්පූර්ණ - මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.12 | පියලිකළ - මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.21 | සම්පූර්ණ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.22 | පියලිකළ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට ශත 25 |
| 3 | 17.01 | | ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනික පවිත්‍ර සුක්‍රෝස් | |
| | | | එකතු කරන ලද රස කාරක හෝ වර්ණ අඩංගු නොවූ ශුද්ධ නොකළ සීනි | |
| | | 1701.12 | බීට් සීනි | කි.ග්‍රෑමයකට ශත 25 |
| | | 1701.13 | උක් සීනි | කි.ග්‍රෑමයකට ශත 25 |
| | | 1701.14 | අනෙකුත් උක් සීනි | කි.ග්‍රෑමයකට ශත 25 |
| | | | අනෙකුත් | |
| | | 1701.91 | එකතු කරන ලද රස කාරක හෝ වර්ණක අඩංගු | |
| | | | | |
| | | 1701.91.10 | සීනි | කි.ග්‍රෑමයකට ශත 25 |
| | | 1701.91.90 | අනෙකුත් | කි.ග්‍රෑමයකට ශත 25 |
| | | 1701.99 | අනෙකුත් | |
| | | 1701.99.10 | සුදු ස්ඵටිකකෘත උක් සීනි | කි.ග්‍රෑමයකට ශත 25 |
| | | 1701.99.20 | සුදු ස්ඵටිකකෘත බීට් සීනි | කි.ග්‍රෑමයකට ශත 25 |
| | | 1701.99.30 | අනෙකුත් සීනි | කි.ග්‍රෑමයකට ශත 25 |
| | | 1701.99.90 | අනෙකුත් | කි.ග්‍රෑමයකට ශත 25 |

10 - 439

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.